# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අනාවරණ පරීක්ෂණය - 2022 (II වාරය)
# 5 ශ්‍රේණිය - මව්බස

5

නම:.............................................................................. කාලය : පැය 1 මිනිත්තු 30

**(01) පහත සඳහන් වාක්‍ය හරි නම් ✓ ලකුණ ද, වැරදි නම් × ලකුණ ද, වරහන තුළ යොදන්න.**

1. මම සැන්දෑ අහස නරඹමි. (...........)
2. අපි සුන්දර පරිසරය ආරක්ෂා කරයි. (...........)
3. මම මිහිරි ගීයක් ගැයුවේ ය. (...........)
4. අපි විනෝද චාරිකාවක් යමු. (...........)

**(02) පහත සඳහන් වාක්‍ය සඳහා සුදුසු ක්‍රියා පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

1. ඔහු දරුවන් ට උපදෙස් ................................... (දෙයි / දෙති)
2. ඈ අලංකාර නිර්මාණයක් .................................. (සාදයි / සාදති)
3. පෙදරේරුවෝ මහල් නිවාස ඉදි ............................ (කරයි / කරති)
4. වල් අලි වගාබිම් පාළු ................................... (කරයි / කරති)

**(03) පහත සඳහන් වාක්‍යවල හිස්තැන් සඳහා වර්තමාන ක්‍රියාපද ලියන්න.**

1. සරුංගලය ඉහළ අහසේ ..........................................
2. නුවර වැවේ නෙලුම් මල් ..........................................
3. ගංගාවෝ මහ මුහුදට ගලා .......................................

**(04) නිවේදනය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

සරසවි විද්‍යාලයීය දූ පුතුන්ගේ කලා කුසලතා එළි දක්වන ''මිණි කිංකිණි'' විවිධ ප්‍රසංගය මෙවරත් උත්කර්ෂවත් අයුරින් 2022 නොවැම්බර් මස 25 වන දින පස්වරු 2.00 ට විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී පැවැත්වීම ට කටයුතු යොදා ඇත. පාසලේ සියලු ම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සහභාගීත්වයෙන් විවිධ ප්‍රසංගය හැඩ ගැන්වීම ට නියමිත ය. එය නැරඹීම සඳහා සියලු ම දෙමව්පියන් ට සහ ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන් ට ඇරයුම් කරන අතර ප.ව. 1.00 වන විට පාසලේ ප්‍රධාන ශාලාවේ අසුන් ගන්නා ලෙස ට දැනුම් දී සිටිමු.

1. විවිධ ප්‍රසංගය පැවැත්වෙන විද්‍යාලය කුමක් ද? .......................................................................
2. විවිධ ප්‍රසංගය නම් කර ඇත්තේ කුමන නමකින් ද? ..................................................................
3. එම ප්‍රසංගය පැවැත්වෙන දිනය කුමක් ද? ..............................................................................
4. ප්‍රසංගය පැවැත්වෙන්නේ කීය ට ද? ......................................................................................
5. විවිධ ප්‍රසංගය පැවැත්වෙන්නේ කුමන ස්ථානයක දී ද? ..........................................................

(05) පහත දී ඇති පෞද්ගලික ලිපියක අංග අනුපිළිවෙළින් සකස් කර ඉදිරියේ ඇති වරහන තුළ අංක යොදන්න.

- අඩංගු කරුණු ( )
- දිනය ( )
- ආශිර්වාදය ( )
- ස්ථානය ( )
- අවසානය ( )
- ආමන්ත්‍රණය ( )

● වචනවල අක්ෂර අනුව අංක 6, 7, 8 ප්‍රශ්නවලට අදාළ ව වගුව සම්පූර්ණ කරන්න.

සුවඳ, දීර්ඝ, සාකච්ඡා, ඇතුළු, රාජධානිය, එළදෙන,
ලඔය, විශිෂ්ට, පණිවිඩ, කඳවුර, කොට්ඨාසය, ගඟ

| (06) මූර්ධජ අක්ෂර | (07) මහප්‍රාණ අක්ෂර | (08) සඤ්ඤක අක්ෂර |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

(09) පහත සඳහන් තේරවිලි තෝරා ලියන්න.

1. නූල් බැඳි අහස් යානාව - ............................................................
2. වත්තල පිංගෙඩිය - ............................................................
3. වන්දි මුදල - ............................................................

(10) ඡේදය හොඳින් කියවන්න. අසා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.

දියකඳ වසා සිටි පෙඳ ඇතිරිල්ල උඩින් ඔරුව පැදවීම අමාරු කාරියක් විය. හබලෙහි ඇවිදීමෙන් හබලත් සමඟ දියෙන් ඉස්සෙන පෙඳ කැටිවලින් පනින කුනිස්සෝ පොරි ඉසින්නාක් මෙන් යළිත් දියෙහි වැටෙති. (මඩොල්දූව - මාර්ටින් වික්‍රමසිංහ)

1. මෙහි සඳහන් වන පරිදි අමාරු කාර්යයක් වූයේ කුමක් ද?
............................................................
2. ඡේදයේ සඳහන් අප්‍රාණවාචී ඒක වචන නාම පදයක් තෝරා ලියන්න.
............................................................
3. ''ඔ'' ශබ්දයෙන් ආරම්භ වන වචනයක් සොයා ලියන්න.
............................................................
4. දික් ඉස්පිල්ල යෙදුණු වචනයක් ඡේදයෙන් සොයා ලියන්න.
............................................................
5. මෙහි ඇතුළත් ප්‍රාණවාචී බහු වචන නාම පදයක් සොයා ලියන්න.
............................................................
6. ඡේදයේ සඳහන් උපමාවක් තෝරා ලියන්න.
............................................................

**(11) පහත වචනවල ඉරි ඇඳ ඇති අකුරේ ඇති පිල්ලම් නම් කරන්න.**

i. රුකඩ - ....................................................

ii. ගම්මුලාදෑනියා - ....................................................

iii. අප්පු - ....................................................

iv. ගැමියෙක් - ....................................................

v. නොතාරිස් - ....................................................

**(12) පහත සඳහන් වචන ගළපා වාක්‍ය සකස් කර තිත් ඉරි මත ලියන්න.**

1. වෙයි / ගලා / පාසල් / දිය / වත්ත / බස්නා / කඳුරක් / අසලින්

....................................................

2. තැත් / අලියා / හඬ / කළේ ය / ගස / තලමින් / පෙරළීමට

....................................................

**(13) පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළුවල අදහස ලියන්න.**

1. මඩේ හිටවපු ඉන්න වගේ

....................................................

2. රයිගමයයි ගම්පළයයි වගේ

....................................................

**(14) පහත පදවලට සමානාර්ථවත් පද ලියන්න.**

1. රාත්‍රිය - ....................................................
2. අවුරුද්ද - ....................................................
3. පොත - ....................................................
4. නෙලුම් මල - ....................................................
5. අර්ථය - ....................................................

**(15) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන තෝරා යටින් ඉරක් අඳින්න.**

1. නිශ්ශබ්ද / නිශ්ෂබ්ද / නිෂ්ශබ්ද
2. නිෂ්ඵල / නිශ්ඵල / නිස්ඵල
3. පුස්ථකාලය / පුශ්ථකාලය / පුස්තකාලය
4. ප්‍රශ්න / ප්‍රස්න / ප්‍රෂ්න
5. ප්‍රතිඵල / ප්‍රථිපල / ප්‍රථිඵල

(16) **පහත සඳහන් වචනවල අර්ථය පැහැදිලි කර ලියන්න.**

1. අභිමුවට - ..........................................................................................................
2. දෛනික - ..........................................................................................................
3. කලල්කර ගන්ඩ - ..........................................................................................................
4. සමර්ථ - ..........................................................................................................
5. පිළියම් - ..........................................................................................................

(17) **පහත කවියේ හිස්තැන සම්පූර්ණ කරන්න.**

ඉර උදා වෙන්න ට
පළමුව නැඟිට සිහි කොට
අලසකම් දුරු කොට
........................................................ ......................

(18) **සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

1. ළමයා .................................... කියවයි.
2. ලේන්නු ............................. අඹ කති.
3. අම්මා උදය ම අවදි .......................................
4. ....................... උදය ම නගරයට ගියා ය.
5. වෛද්‍යවරයා ලෙඩුන්ට ප්‍රතිකාර .......................................
6. ...................................... කුඹුරු කොටයි.
7. මිනිස්සු .................................. කපති.
8. ............................... රූපවාහිනිය නරඹයි.
9. ................................ නගරයට යමි.
10. ........................... බුදුන් වැන්දෙමු.

(19) **හිස්තැනට වඩාත් ම සුදුසු යෙදුමෙහි අංකය හිස් තැනෙහි ලියන්න.**

1. **මොර සූරන වැස්ස**
2. **අනූ නවයෙන් බේරුණා**
3. **එක හුස්මට**
4. **ඉහේ මලක් පිපුණා**
5. **අකුරක් නැර**

1. මල්ලී කතාව ............................................................. කියාගෙන ගියේ ය.
2. නිවාඩු කාලයේ දී මම පෙළපොත ............................................................... කියවූයෙමි.
3. සීයා දුටු මම ................................................................... මෙන් සතුටින් කැගැසුවෙමි.
4. අත්ත දිගේ පැමිණි ගැරඬියාගෙන් ලේන් පැටියා ........................................................
5. ............................................................ නිසා ඇළ දොළ පිටාර ගලන්නට විය.

- **අංක 20 සහ 21 ප්‍රශ්නවලට කොටුව තුළ ඇති උක්ත පද අනුක්ත පද වෙන් කර ලියන්න.**

| | | | |
|---|---|---|---|
| ගෙවිලියෝ | දරුවන් | ඇතින්නියක | තරුණයෙකු |

(20)




.............................................

.............................................

(21)




.............................................

.............................................

**(22) පහත දැක්වෙන වැකිවල සුදුසු විරාම ලක්‍ෂණ යොදන්න.**

1. ඇත්තමයි ඉතුරු වුණු සතේ නොදුන්නනං කොච්චර හොඳ ද
2. මේ ලිලී අම්මා හෙවත් වයලට් ආච්චි පාසලට පැමිණියේ අමුතු ම රාජකාරියකට ය
3. ළමයි වෙරළේ ඇවිදිමින් සිප්පි කටු කවඩි හක්කැට හා බට්ටන් අහුල අහුලා ඔඩොක්කුවල පුරවා ගනිති

**(23) පහත සංකේත හඳුනාගෙන ගැළපෙන පරිදි යා කරන්න.**





පිරිමි වැසිකිළිය

ආබාධිත අය සඳහා

කාන්තා වැසිකිළිය

ආපණශාලාව





**(24) පහත වාක්‍යයෙහි ඇති උපමාව වෙන් කර ලියන්න.**

1. රළය බිඳ වැටීමෙන් ගලන වතුරෙන් කොටසක්, තීන්ත පොවන කඩදාසියකින් තීන්ත උරා ගන්නාක් මෙන්, බුරුල් පස් අතරින් පොළොව උරා ගනියි.

   ..............................................................................................................................

2. ගසක කොළයක් පවා සොලවන තරම් සුළඟකුදු නොහැමු නිසා නිසංසල වූ දිය ඇති නදිය, නිල් මිණි තලාවක් සේ බබළයි.

   ..............................................................................................................................

**(25) පහත විස්තරය කියවා එහි ඇතුළත් විස්තර අනුව ආකෘති පත්‍රය සම්පූර්ණ කරන්න.**

වර්ෂ 2012 ජූනි 26 වන දින උපත ලැබූ කෞෂල්‍යා එරන්දක මප/මහ/සඳගලතැන්න මහා විද්‍යාලයේ 5 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබයි. සිංහල බෞද්ධයෙකු වූ ඔහුගේ පියා වීරසිංහ ආරච්චිගේ අජිත් කුමාර ගුරුවරයෙකි. මහනුවර, ගැටඹේ, ප්‍රබෝධ මාවතේ අංක 61/2 දරණ නිවසේ පදිංචි කෞෂල්‍යාගේ මව වාසල මුදලිගේ කාව්‍යා චිත්‍රාංගනී වික්‍රමසිංහ වන අතර ඇය ගෘහණියකි.

**<u>ආකෘති පත්‍රය</u>**

1. වාසගම සහිත සම්පූර්ණ නම : ..........................................................................................................
2. පෞද්ගලික ලිපිනය : ..........................................................................................................
3. උපන් දිනය : වර්ෂය: .................... මාසය:.................... දිනය: ..........................
4. ස්ත්‍රී / පුරුෂ භාවය : (අදාළ කොටුවේ ✓ලකුණ යොදන්න)

   ස්ත්‍රී ☐ පුරුෂ ☐
5. ජාතිය : සිංහල ☐ දෙමළ ☐ මුස්ලිම් ☐ බර්ගර් ☐ වෙනත් ☐
6. ආගම : බෞද්ධ ☐ හින්දු ☐ කතෝලික ☐ ක්‍රිස්තියානි ☐

   ඉස්ලාම් ☐ වෙනත් ☐
7. ඉගෙනුම ලබන පාසල : ..........................................................................................................
8. ඉගෙනුම ලබන ශ්‍රේණිය : ..........................................................................................................
9. මව / පියා / භාරකරුගේ නම : ..........................................................................................................

(26) **''අපේ ගෙවත්ත'' යන මාතෘකාව ඇසුරින් නිර්මාණාත්මක වාක්‍ය 05 ක් ලියන්න.**

එම වාක්‍ය මාතෘකාවට අදාළ විය යුතුය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු අතර ලිඛිත භාෂාවෙන් ලිවිය යුතුය.

i. ..........................................................................................................

..........................................................................................................

ii. ..........................................................................................................

..........................................................................................................

iii. ..........................................................................................................

..........................................................................................................

iv. ..........................................................................................................

..........................................................................................................

v. ..........................................................................................................

..........................................................................................................